සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත්:** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව **I** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

**1.** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **(i)** සිට **(x)** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යවසායකත්ව කළමනාකරණය පිළිබඳ උපාධිධාරිණියක වන හලාවත පදිංචි උදාරි තම ප්‍රදේශයේ විශාල පොල් වතු හිමියන්ගෙන් ලෙලි සහිත පොල් මිල දී ගෙන කපාපු පොල්, කොප්පරා, පොල්කටු හා පොල් කෙඳි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදිත අපනයනය කිරීමේ ව්‍යාපාරයක් 'කප්රුක නිෂ්පාදිත' නමින් පවත්වා ගෙන යයි.

'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් 01 දිනට පහත ගිණුම් ශේෂ පැවතුණි.

| | රු. |
|---|---|
| • මුදල් ශේෂය | 12 000 |
| • ණයගැතියෝ | 18 000 |
| • ණයහිමියෝ | 50 000 |
| • උපකරණ | 250 000 |
| • ඉඩම් හා ගොඩනැගිලි | 100 000 |

2018 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් මාසය තුළදී පහත ගනුදෙනු සිදු විය.

| | රු. |
|---|---|
| • අත්පිට ගැනුම් (ලෙලි පොල්) | 200 000 |
| • ණයට ගැනුම් (ලෙලි පොල්) | 100 000 |
| • ණයට විකුණුම් | 200 000 |
| • අත්පිට විකුණුම් | 400 000 |
| • ගෙවූ නිෂ්පාදන සේවක වැටුප් | 70 000 |
| • නිෂ්පාදිත ප්‍රවාහනය සඳහා ගෙවූ වියදම් | 60 000 |
| • ගෙවූ ගෙන ඒමේ කුලී | 20 000 |
| • ගෙවිය යුතු විදුලි ගාස්තු | 6 000 |

විශාල පොල් ඉඩම් කැබලි කර විකිණීම හා පොල් කෘමි උවදුර හේතුවෙන් කාලීනව ලබා ගත හැකි පොල් ප්‍රමාණය අඩු වෙමින් පවතින බැවින් පොල් භාවිතයේදී සිදු වන නාස්තිය අවම කිරීමට උදාරි රසකාරක රහිත පිටි කළ පොල් නිෂ්පාදිතයක් හඳුන්වා දුන්නා ය.

එම නිෂ්පාදිතය, අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරන ලද ප්‍රදර්ශනයක් සඳහා ඉදිරිපත් කළ අතර, එහිදී හඳුනාගත් විදේශීය ගැනුම්කරුවකු පිටි කළ පොල් පැකට් 10 000 ක් සඳහා වන ඇණවුමක් විද්‍යුත් තැපෑලෙන් (E-Mail) එවා ඇත. 2018 දෙසැම්බර් 31 දිනට පෙර එම තොග නැව්ගත කරන බව උදාරි විසින් දුරකථනයෙන් දැනුම් දී ඇත.

තම පිටි කළ පොල් නිෂ්පාදනය පුළුල් කිරීමට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති බැවින් උදාරි රු. 500 000 ක බැංකු ණය මුදලක් අයදුම් කර ඇත. පොල් හා පොල් නිෂ්පාදිත ප්‍රවාහනය සඳහා රු. 300 000 කට කුඩා ලොරි රථයක් අමර මෝටර්ස් වෙතින් 2018.10.31 දින ණයට ලබා ගන්නා ලදී.

උපකරණ වාර්ෂිකව 12% බැගින් ක්ෂය කරන අතර, 2018.10.31 දිනට ඉතිරි තොග කිසිවක් නොවී ය.

(i) (අ) ඉහත සිද්ධියේ සඳහන් 'කප්රුක නිෂ්පාදිත ව්‍යාපාරය' අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) මෙම ව්‍යාපාරයේ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලෙලි පොල් කුමන නිෂ්පාදන සාධකයකට අයත් වේ ද?

[අටවැනි පිටුව බලන්න.

(ii) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ ශක්තියක්, දුර්වලතාවක්, අවස්ථාවක් හා තර්ජනයක් සඳහා නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න.

(iii) (අ) පහත සඳහන් ප්‍රකාශ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත් වේ ද?

1. පිටිකළ පොල් පැකට් නිෂ්පාදනය කිරීම
2. පිටිකළ පොල් පැකට් අපනයන ප්‍රවර්ධන මණ්ඩලයේ ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීම

(ආ) පහත සඳහන් ප්‍රකාශ කුමන කළමනාකරණ කාර්යයට අයත් වේ ද?

1. 2018.12.31 දිනට පෙර පිටිකළ පොල් පැකට් තොගය නැවත කිරීමට තීරණය කිරීම
2. කුඩා ලොරි රථයක් කුලියට ගැනීම

(iv) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරය ලබා ගෙන ඇති උපකාරක සේවා **දෙකක්** සඳහන් කර, එම උපකාරක සේවා ලබා ගෙන ඇති බව තහවුරු කිරීමට සිද්ධියේ සඳහන් නිදසුන බැගින් ලියන්න. පිළිතුරු සැපයීමට පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.

| උපකාරක සේවා | නිදසුන |
|---|---|
| 1. [illegible] | |
| 2. [illegible] | |

(v) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.01 දිනට හිමිකම කොපමණ ද?

(vi) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ සෘජු පිරිවැයක් හා වක්‍ර පිරිවැයක් වටිනාකම් සහිතව ලියන්න.

(ආ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ වගකීම් වැඩි වීමට බලපාන ගනුදෙනුවක් ලියන්න.

(vii) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් මාසය සඳහා පොදු ජර්නලය පිළියෙල කරන්න.

(viii) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

(ආ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.31 දිනට ජංගම වත්කමක් හා ජංගම වගකීමක් වටිනාකම් සහිතව ලියන්න.

(ix) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018 ඔක්තෝබර් මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

(x) (අ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ හිමිකම් ගිණුමක් හා ආදායම් ගිණුමක් සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) 'කප්රුක නිෂ්පාදිත' ව්‍යාපාරයේ 2018.10.31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණ ද?

(ලකුණු 02 × 10 = 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) (අ) මිනිස් අවශ්‍යතාවක් යනු කුමක් ද?

(ආ) මිනිස් අවශ්‍යතාවල ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරය තුළින් විවිධ අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන සේවකයෝ එම ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත් වේ.

(ආ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ව්‍යාපාර භාවිත කරන ස්වාභාවික සම්පත් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

(ඉ) සමුපකාර සමිති ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි.

(ඊ) නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර හා සේවා සපයන ව්‍යාපාර ලෙස වර්ග කළ හැකි ය. (ලකුණු 02 යි)

(iii) අමා සහ රසාංගා ඇඹිලිපිටියේ පදිංචි පසිඳුගෙන් නැවුම් කිරි මිලට ගෙන, මීකිරි නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 'අමරස මීකිරි' නමින් පවත්වා ගෙන යයි.

(අ) මෙම සිද්ධියේ සඳහන් වන අමරස මීකිරි ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් වුවමනාව කුමක් ද?

(ආ) මෙම සිද්ධියේ සඳහන් පසිඳුගේ ව්‍යාපාර සංවිධාන වර්ගයට සාපේක්ෂව 'අමරස මීකිරි' නිෂ්පාදන ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

(iv) ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ මිල ඉහළ යාම නිසා ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ ගොස් ඇත.

(අ) ඉහත ප්‍රකාශයෙන් ගම්‍ය වන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?

(ආ) ඛනිජ තෙල් භාවිතය අවම කිරීම සඳහා ආදේශකයක් යෝජනා කරන්න. (ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**3.** (i) (අ) සිල්ලර වෙළෙඳාම යනු කුමක් ද?

(ආ) වාණිජ බැංකුවක පවත්වා ගෙන යන ගිණුම් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳාම අතර ඇති ප්‍රධානතම වෙනස වන්නේ මිල දී ගන්නාගේ චේතනාව ය.

(ආ) විශේෂ රේඛනය සහිත චෙක්පතක් ඕනෑම වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක තැන්පත් කළ හැකි ය.

(ඉ) දේපළ රක්ෂණයේදී අවදානම නිශ්චිත වන අතර ජීවිත රක්ෂණයේදී අවදානම අවිනිශ්චිත වේ.

(ඊ) සන්නිවේදන ක්‍රියාවලියේදී පණිවිඩය යවන්නා පණිවිඩය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය ප්‍රතිචාරයයි.

(ලකුණු 02 යි)

(iii) සාරංගා බතික් නිෂ්පාදකයෝ විසින් බතික් නිර්මාණ තොගයක් සිංගප්පූරුවේ සිටින රමේෂ්ට ගුවන් මගින් යවන ලදී.

(අ) මෙහි සඳහන් ආනයනකරු හා අපනයනකරු නම් කරන්න.

(ආ) මෙහි සඳහන් ප්‍රවාහන ක්‍රමයට අදාළ ප්‍රවාහන මූලිකාංග වන මාර්ගය හා මාධ්‍යය සඳහා නිදසුන් වෙන වෙන ම දක්වන්න.

(ලකුණු 02 යි)

(iv) විමල්ගේ රු. 2 000 000 ක් වටිනා මෝටර් රථය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එම වටිනාකමට රක්ෂණය කර තිබූ අතර එම රථය අනතුරකට භාජනය වී රු. 500 000 ක අලාභයක් සිදු විය. එම අවස්ථාවේ පදික වේදිකාවේ ගමන් කරමින් සිටි සුනිමල්ට ද සුළු තුවාල සිදු විය.

ඉහත සිද්ධියේ රක්ෂණයට සම්බන්ධ පහත දෑ සඳහන් කරන්න.

(අ) පළමු පාර්ශ්වය

(ආ) දෙවන පාර්ශ්වය

(ඉ) තෙවන පාර්ශ්වය

(ඊ) විමල්ට ලැබෙන වන්දි මුදල

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**4.** (i) (අ) 'කළමනාකරණය' යනු කුමක් ද?

(ආ) සාමාන්‍ය කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරය සැලසුම් කළ කටයුතු ඒ ආකාරයෙන්ම සිදු වී ඇත් දැයි සොයා බැලීම සැලසුම්කරණයයි.

(ආ) ව්‍යාපාරයකට වඩාත් ආකර්ෂණීය ලෙස මෙන්ම ලාභදායි ලෙස තෘප්තිමත් කළ හැකි පාරිභෝගික කොටස ඉලක්ක වෙළෙඳපොළ වේ.

(ඉ) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුත්තේ එම ආයෝජනයේ අවදානම පමණි.

(ඊ) පුද්ගලයකු උපයා ගත් ආදායමෙන් ඉතිරි කර ගත් මුදලක් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායි මාර්ගයක යෙදවීම ආයෝජනය නම් වේ.

(ලකුණු 02 යි)

(iii) ඉහළ අවදානම් දැරීමට අකැමැති රත්නා විසින් රු. 1 200 000 කට මිලට ගත් ඉඩම් කැබැල්ල වර්ෂයකට පසු රු. 1 500 000 කට විකුණන ලදී. ඇය මෙම මුදල ඉදිරි මාසය තුළදී තම දියණියගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂා කරයි.

(අ) ඉඩම විකිණීම නිසා රත්නාට ලැබුණු ප්‍රතිලාභයේ වටිනාකම කොපමණ ද?

(ආ) ඉහත (අ) හි ප්‍රතිලාභය හඳුන්වන නාමය කුමක් ද?

(ඉ) දියණියගේ අධ්‍යාපන කටයුතුවලට යොදවන තෙක් රත්නාගේ මුදල් ආයෝජනය කිරීමට වඩාත් සුදුසු ආයෝජන මාර්ගය කුමක් ද?

(ඊ) ඉහත (ඉ) හි ඔබගේ යෝජනාවට හේතුව දක්වන්න.

(ලකුණු 02 යි)

(iv) පාසලේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව සඳහා 2018 මාර්තු මස 31 වන දින අනුරාධපුරය හා පොළොන්නරුව නැරඹීමට සංවිධායකයින් විසින් තීරණය කරන ලදී. ප්‍රථමාධාර සහ සංග්‍රහ කමිටු සඳහා සිසුන් පත් කරන ලදී. චාරිකාව නිමවූ පසු, එහි ප්‍රගතිය පිළිබඳව විදුහල්පතිතුමා විමසූ අතර, පන්ති භාර ගුරුතුමිය විසින් චාරිකාවේ වාර්තාව ද සපයන ලදී.

(අ) ඉහත සිද්ධියේ සඳහන් වන කළමනාකරණ කාර්ය **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ඉහත 'අ' හි සඳහන් කළ එක් එක් කළමනාකරණ කාර්යය සඳහා නිදසුන බැගින් ලියන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) (අ) වත්කමක් යනු කුමක් ද?

(ආ) හිමිකම් ගිණුම්වලට අදාළ ද්විත්ව සටහන් මූලධර්මය ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් වන්නේ ලි බඩු වෙළෙඳසැලක සිදු වූ ගනුදෙනු දෙකකි.

(අ) කළමනාකරුගේ ප්‍රයෝජනය සඳහා විධායක පුටුවක් රු. 20 000 කට ලක්මල් ලි බඩු වෙළෙඳසැලෙන් ණයට ගැනීම

(ආ) රු. 15 000 ක මේසයක් කසුන්ට ණයට විකිණීම

ඉහත එක් එක් ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

(iii) විදුලි උපකරණ අලෙවි කරන සමන්තගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි 31 දිනෙන් අවසන් වූ මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 100 000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම
2. රු. 50 000 ක් වටිනා විදුලි උපකරණ තොගයක් ණයට ගැනීම
3. ණයහිමියන්ට රු. 8 000 ක් මුදලින් ගෙවීම
4. රු. 25 000 ක් පිරිවැය වූ විදුලි උපකරණ තොගයක් රු. 40 000 කට අත්පිට මුදලට විකිණීම
5. සමන්ත පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5 000 ක් ව්‍යාපාරයේ මුදලින් ගැනීම

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම
(පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න. පළමු ගනුදෙනුව සටහන් කර ඇත.)

| ගනුදෙනුව | වත්කම් (රු.) | | | = හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|---|
| | ලිබඩු හා උපකරණ | තොගය | මුදල් | හිමිකම් | බැංකු ණය | ණයහිමියෝ |
| 2018.01.01 දිනට ශේෂය | 160 000 | 70 000 | 25 000 | 235 000 | – | 20 000 |
| 1 | – | | + 100 000 | | + 100 000 | – |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |

(ආ) 2018.01.31 දිනට සමන්තගේ ව්‍යාපාරයේ පහත සඳහන් අයිතමවල අගය කොපමණ ද?

1. ජංගම වත්කම්
2. ජංගම නොවන වත්කම්
3. ජංගම වගකීම්
4. ජංගම නොවන වගකීම්

(ලකුණු 04 යි)

/එකොළොස්වැනි පිටුව බලන්න.

(iv) තුෂාරගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2018 මැයි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. 2018.05.03 – එකක් රු. 200 බැගින් තේ කොළ පැකට් 20 ක් සමීරගෙන් ණයට ගැනීම (ඉන්. අංක 612) අඩු කළ වෙළෙඳ වට්ටම 5%
2. 2018.05.05 – එකක් රු. 15 බැගින් පිත්තර 20 ක් අත්පිට මුදලට ගැනීම (ලදුපත් අංක 25)
3. 2018.05.18 – එකක් රු. 5.00 බැගින් ගිනි පෙට්ටි 100 ක් පහන්ගෙන් ණයට ගැනීම (ඉන්. අංක 305)
4. 2018.05.23 – ටෙක්නෝ වෙළෙන්දෝ වෙතින් රු. 25 000 ක් වටිනා පරිගණක මේසයක් ණයට ගැනීම

**අවශ්‍ය වන්නේ:**

(අ) 2018 මැයි මාසය සඳහා තුෂාරගේ ව්‍යාපාරයේ ගැනුම් ජර්නලය පිළියෙල කිරීම

(ආ) 2018.05.31 දිනට ගැනුම් ජර්නලයේ තොරතුරු ලෙජර් ගිණුම්වලට පිටපත් කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

6. (i) (අ) බැංකු ප්‍රකාශය යනු කුමක් ද?

(ආ) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශයේ ශේෂය වෙනස්වීමට හේතු විය හැකි කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) අල්මාරි නිෂ්පාදනය කරන සඳුන්ගේ ව්‍යාපාරයේ 2018 නොවැම්බර් මාසයේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- ※ ලී සඳහා වියදම රු. 100 000
- ※ මාසික විදුලි ගාස්තුව රු. 2 500
- ※ වඩු කාර්මික වැටුප් රු. 60 000
- ※ වෙනත් සෘජු වියදම් රු. 17 500
- ※ වඩු මඩුවේ කුලිය රු. 20 000

නොවැම්බර් මාසය තුළ නිෂ්පාදනය කළ අල්මාරි ගණන 5 කි. අල්මාරියක විකුණුම් මිල රු. 50 000 කි.

**අවශ්‍ය වන්නේ:**

(අ) 2018 නොවැම්බර් මාසයට අදාළ ප්‍රාථමික පිරිවැය

(ආ) එක් අල්මාරියක් විකිණීමෙන් ලැබෙන ලාභය (ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යාපාරයක ගිණුම් තැබීමේදී සිදු වූ වැරදි නිවැරදි කිරීම සඳහා තබා තිබූ අසම්පූර්ණ ජර්නල් සටහන් දෙකක් පහත දැක්වේ.

**පොදු ජර්නලය**

| | දිනය | වවුචර් අංකය | විස්තරය | ලෙජ | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|---|---|---|
| (1) | 2018.03.31 | 101 | ගැනුම් ගිණුම හර<br>ණයහිමි ගිණුම<br>(.................................) | | 40 000 | 40 000 |
| (2) | | 102 | කාර්යාල උපකරණ ගිණුම හර<br>ගැනුම් ගිණුම<br>(.................................) | | 20 000 | 20 000 |

**අවශ්‍ය වන්නේ:**

ඉහත වැරදි නිවැරදි කිරීම්වලට අදාළ සංලක්ෂ වෙන වෙන ම ලියා දැක්වීම (ලකුණු 02 යි)

(ආ) සුනිල්ගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම සමාන නොවූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කරන ලදී.
පහත දැක්වෙන්නේ සුනිල්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමෙන් පසු පිළියෙල කරන ලද අවිනිශ්චිත ගිණුමයි.

**අවිනිශ්චිත ගිණුම**

| දිනය | විස්තරය | සැ/පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | සැ/පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | ශේෂ පිරික්සුමේ වෙනස | | ......... | | උපකරණ ගිණුම | | 12 000 |
| | විකුණුම් ගිණුම | | 5 000 | | විදුලි ගාස්තු ගිණුම | | 4 000 |
| | ගැනුම් ගිණුම | | 2 000 | | | | |

**අවශ්‍ය වන්නේ:**

1. වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂ පිරික්සුමේ වෙනස
2. අවිනිශ්චිත ගිණුමේ ශේෂය ඇතුළත් කිරීමට පෙර 2018.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 85 000 වූයේ නම් ශේෂ පිරික්සුමේ බැර තීරුවේ එකතුව

(ලකුණු 02 යි)

(iv) 2018.10.31 දිනට සපුමල්ගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර ශේෂය රු. 16 000 ක් විය. එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය එම ශේෂය හා නොගැළපුණි.
පසුව වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කර ගන්නා ලදි.

1. මාසය තුළ තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 5 000
2. බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව අය කළ ගාස්තු රු. 500
3. මාසය තුළදී නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු. 8 000
4. බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුවට සෘජුවම ලැබුණු ණයගැති ප්‍රේෂණ රු. 2 000

**අවශ්‍ය වන්නේ:**

(අ) 2018.10.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම
(ආ) 2018.10.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම

(ලකුණු 04 යි)
**(මුළු ලකුණු 12 යි)**

7. (i) (අ) තනි පුද්ගල ව්‍යාපාරයක පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මොනවා ද?
(ආ) ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ලකුණු 02 යි)

(ii) ලගිරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 60 දෙනෙකි. එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 1 000 කි. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ අසම්පූර්ණ ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් ප්‍රකාශය පහත දැක්වේ.

**ලගිරු ක්‍රීඩා සමාජයේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| සාමාජික මුදල් | A | ලිපිද්‍රව්‍ය වියදම් | 5 000 |
| කොඩි විකිණීමෙන් ලැබීම් | 8 000 | ප්‍රවාහන ගාස්තු | 8 500 |
| | | උත්සව වියදම් | 12 500 |

**ලගිරු ක්‍රීඩා සමාජයේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | රු. |
|---|---|
| **ආදායම්:** | |
| සාමාජික ගාස්තු | 60 000 |
| කොඩි විකිණීමෙන් ආදායම | B |
| **වියදම්:** | |
| ප්‍රවාහන ගාස්තු | C |
| උත්සව වියදම් | 12 500 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 5 000 |

/දහතුන්වැනි පිටුව බලන්න.

**අමතර තොරතුරු:**

- සාමාජිකයින් අටදෙනකු වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත.
- 2018.03.31 දිනට උපචිත ප්‍රවාහන ගාස්තු රු. 2 000 කි.
- කොටි විකිණීමෙන් ලැබිය යුතු මුදල රු. 600 කි.

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත A, B හා C යන ස්ථාන සඳහා නිවැරදි වටිනාකම් වෙන වෙන ම

(ආ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයේ අතිරික්තය හෝ ඌනතාව

(ලකුණු 02 යි)

(iii) කවිඳුගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැය) | 300 000 | |
| ප්‍රාග්ධනය | | 500 000 |
| බෙදාහැරීමේ මෝටර් රථය (පිරිවැයට) | 400 000 | |
| බෙදාහැරීමේ මෝටර්රථ ක්ෂය වෙන් කිරීම (2017.01.01 දිනට) | | 60 000 |
| 2017.01.01 දිනට තොගය | 25 000 | |
| 9% බැංකු ණය | | 100 000 |
| ගැනුම් | 150 000 | |
| විකුණුම් | | 240 000 |
| වේතන | 8 000 | |
| ණයගැතියෝ | 20 000 | |
| ණයහිමියෝ | | 17 000 |
| ලද වට්ටම් | | 3 000 |
| දුන් වට්ටම් | 1 000 | |
| ගෙන ඒමේ කුලී | 1 500 | |
| ගෙවූ බැංකු ණය පොලී | 4 500 | |
| බොල් ණය | 800 | |
| විදුලි ගාස්තු | 2 000 | |
| වරිපනම් | 200 | |
| මුදල් ශේෂය | 7 000 | |
| | 920 000 | 920 000 |

**අමතර තොරතුරු:**

* 2017.12.31 දිනට තොගය රු. 25 000

* බෙදාහැරීමේ රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කෙරේ.

* ණයගැතියන්ගෙන් රු. 1 200 ක් බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කරන ලදී.

**අවශ්‍ය වන්නේ:**

(අ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ලකුණු 04 යි)

(ආ) 2017.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

* * *